# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION


සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>2171635<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011- |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1575/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 13/10/2024<br>පැය 0805 |

## මාධ්‍ය නිවේදනය

**01. මනුෂ්‍ය ඝාතනයක් - අරණායක පොලිස් වසම.**

2024.10.12 වන දින රාත්‍රී කාලයේ අරණායක පොලිස් වසමේ වැලිකුඹුර ප්‍රදේශයේ මාර්ගයක හිසේ ලේ ගලන තුවාල සහිතව පුද්ගලයෙකු වැටී සිටින බවට අරණායක පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත. තුවාලකරු දිප්පිටිය රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 50 ක් වූ වැලිකුඹුර, අරණායක ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරුගේ හිසට පහරදීමක් හේතුවෙන් මියගොස් ඇති බවට රෝහලේ වෛද්‍යවරයා විසින් දැනුම් දීමෙන් පසු මෙය මනුෂ්‍ය ඝාතනයක් ලෙස විමර්ශන කටයුතු ආරම්භ කර ඇත. මෘත ශරීරය දිප්පිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර, සිද්ධියට සම්බන්ධ සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා අරණායක පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය.**

2024.10.12 වන දින සවස් කාලයේදී මිහිජය සෙවණ පොලිස් වසමේ දී පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 100 මිලිග්‍රෑම් 400 ක් සන්තකයේ තබාගෙන කාර් රථයකින් ගමන් කරමින් සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 44 ක් වන හේනමුල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - වාද්දුව පොලිස් ස්ථානය.**

2024.10.12 වන දින දහවල් කාලයේදී වාද්දුව පොලිස් වසමේ පොතුපිටිය ප්‍රදේශයේදී වාද්දුව පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 250 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 36 ක් වන වාද්දුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වාද්දුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මකුළුගස්වැව පොලිස් ස්ථානය.**

2024.10.12 වන දින සවස් කාලයේදී මකුළුගස්වැව පොලිස් වසමේ දේවහුව ප්‍රදේශයේදී මකුළුගස්වැව පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 33 ක් වන දේවහූව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මකුළුගස්වැව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05. මාරක රිය අනතුරක් - මැදිරිගිරිය පොලිස් වසම.**

2024.10.12 වන දින දහවල් කාලයේ මැදිරිගිරිය පොලිස් වසමේ කුසුම්පොකුණ පිංපාර මාර්ගයේ ගිණිසුරු හන්දිය ආසන්නයේදී පිංපාර දෙස සිට කුසුම්පොකුණ දෙසට ධාවනය වූ කුඩා අත් ට්‍රැක්ටරයක් රියදුරුට පාලනය කර ගත නොහැකිව පෙරළීමෙන් රියදුරු ට්‍රැක්ටරයට යටවීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ රියදුරු මැදිරිගිරිය රෝහලට ඇතුලත් කර වැඩිදුර ප්‍රතිකාර සඳහා පොළොන්නරුව රෝහලට මාරු කර යැවීමෙන් පසු ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 49 ක් වූ කුසුම්පොකුණ, දිවුලංකඩවල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය පොළොන්නරුව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. මැදිරිගිරිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**